**සූරියවැව ප්‍රාදේශීය සභාව - 2023**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

සූරියවැව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට සූරියවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන්, අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සහ JCB යන්ත්‍රය සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම වෙනුවෙන් ගිණුම් අතර මාරුකර ගත් රු.4,448,513 ක් සභාවේ ආදායමක් සහ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ ආදායම සහ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | ඉදිරි වර්ෂවල ගිණුම් සැකසීමේදී මෙවැනි ආදායම් හා වියදම් සටහන් නොකරන බව. | අංශ අතර හඳුනාගත් ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් නොකළ යුතුය. |
| (ආ) | මදුනාගල කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කර තිබූ රු.974,067 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මුදල් ගිණුම් 03 ක් අතර සිදුව තිබූ රු.241,990 ක මුදල් හුවමාරුව එම ගිණුම්වලට ගැලපීම් නොකර ජංගම වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂවලදී මුදල් හුවමාරු කර ගැනීම් නිවැරදිව සටහන් කරන බව. | ගිණුම් අතර සිදුවන ගණුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2022 වර්ෂයේ ක්‍රියාත්මක කළ සූරියවැව සතිපොළ පොදු වැසිකිලිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ප්‍රතිපූර්ණ විය යුතු රු.2,089,866 ක් කර්මාන්ත ණයගැතියන් යටතේ ගිණුම්ගත කළ යුතු වුවත්, එසේ නොකර පොදු ණයගැතියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | වියදම් සහා අරමුදලින් දරා ඇති බැවින් සහා අරමුදලේ ණයගැතියෙකු ලෙස ගිණුම්ගත කළ බව. | ණයගැතියන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | මදුනාගල කසළ අංගනය වටා විදුලි වැටක් ඉදිකිරීමට ශ්‍රමික කුලිය හැර වැයකර තිබූ වටිනාකම රු.1,395,382 ක් වුවත්, ඉඩම් හා ගොඩනැගිලි යටතේ රු.2,000,000 ක් ලෙස ප්‍රාග්ධනිත කිරීමෙන් රු.604,618 ක් වැඩිපුර ගිණුම්ගත වී තිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම මගින් නිවැරදි කරන බව. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | දිරිය සුරක්ෂණ වැඩසටහන 2024 වර්ෂයේදී ද ක්‍රියාත්මක කිරීම සඳහා වියදම් දැරීම වෙනුවෙන් රු.1,020,000 ක ගිවිසුම්ගත නොවූ ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම සහ ණයහිමි වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | පෙර පාසල් දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කළ බව. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ ලද රු.500,000 ක හිඟ වැටුප් ප්‍රතිපූර්ණ සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු නොකර වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩියෙන් දැක්වුණි. | ඉදිරි වර්ෂවල ගිණුම් සැකසීමේදී නිවැරදිව ගැළපීම් කිරීමට කටයුතු කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් හා සමාලෝචිත වර්ෂයේදී ලද උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් රු.1,700,000 ක් වර්ෂයේ අවසානයට වගකීමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර ඊට අදාළ වර්ගීකරණ විස්තරයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වර්ගීකරණ සාරාංශයක් සභාව වෙත නොලද බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය | 2017 වර්ෂයේදී දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගත් වසම් 02 ක පිහිටි දේපල 1159 ක් සඳහා 2023 වර්ෂයේදී වරිපනම් බදු අය කර නොතිබුණි. | වරිපනම් බදු තක්සේරුවක් ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදල් ගෙවා ඇති බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය | 2023 වර්ෂයට පමණක් සුවපෝෂනී පෝෂණ වැඩසටහන වෙනුවෙන් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී වියදම් දැරීම වෙනුවෙන් රු.1,020,000 ක ණයහිමි ප්‍රතිපාදන වෙන්කර ගෙන 2024 අප්‍රේල් 05 දින වන විට රු.478,207 ක් වැයකර තිබුණි. | පෙර පාසල් දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,371,525 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,326,764 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් බදු | 2,131,000 | 2,921,420 | 2,987,555 | 94,035 | 2,163,000 | 1,273,390 | 3,381,060 | 160,170 |
| කුලී | 41,775,500 | 45,733,014 | 51,963,710 | 5,989,886 | 36,585,500 | 31,583,026 | 24,767,841 | 12,220,577 |
| බලපත්‍ර ගාස්තු | 1,379,000 | 1,695,600 | 2,474,175 | 108,200 | 1,440,600 | 1,427,004 | 2,115,154 | 886,775 |
| වෙනත් ආදායම් | 4,718,500 | 4,221,076 | 6,479,466 | 2,580,765 | 4,725,200 | 7,955,038 | 5,216,908 | 4,839,156 |
| **එකතුව** | **50,004,000** | **54,571,110** | **63,904,906** | **8,772,886** | **44,914,300** | **42,238,458** | **35,480,963** | **18,106,678** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩ කාමර 55 කින් ලැබිය යුතු එකතුව රු.877,648 ක කුලී හා ව්‍යාපාර ඒකක 91 කින් 2019 හා 2023 වර්ෂයන් අතර කාලය වෙනුවෙන් ලැබිය යුතු රු.69,500 ක බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ පිළිවෙළින් 159 (1) හා 149 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කඩ කාමර කුලී හා බලපත්‍ර ගාස්තු හිඟයෙන් පිළිවෙළින් රු.141,076 ක් හා රු.13,500 ක් අයවී ඇති අතර හා බලපත්‍ර ගාස්තු හිඟයෙන් රු.3,000 ක් සඳහා නඩු පවරා ඇති බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයන්ට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසානයට බදු දේපළ 11 ක වෙළඳ අයිතිය බදු දීම මත ලැබිය යුතු රු.2,206,556 ක් හා කඩ කාමර 10 කින් ලැබිය යුතු රු. 452,591 ක එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බදු දේපළ හිඟයෙන් රු. 907,032 ක් අයකර ගෙන ඇති අතර රු.481,239 ක් කපාහැරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කළ බව | හිඟ ආදායම් හා එක්වන් මුදල් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙළින් රු.3,313,665 ක් හා රු.729,500 ක් විය. | උසාවි දඩ හිඟයෙන් රු.1,501,000 ක් ලද බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ නිල කාලය 2023 මාර්තු 18 දිනෙන් අවසන්ව තිබූ අතර මාර්තු මාසයට අදාළ සභික දීමනා, ඉන්ධන දීමනා හා දුරකථන දීමනා ගෙවීමේදී දින 18 කට පමණක් ගෙවිය යුතු වුවත්, එපරිදි කටයුතු නොකර මාර්තු මාසය සඳහා මුළු දීමනාවම ගෙවීම් කර තිබීම නිසා වැඩිපුර ගෙවන ලද රු.86,598 ක් වගකිවයුතු පාර්ශවයන්ගෙන් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගැනීම සඳහා මන්ත්‍රී මණ්ඩලයට ලිපි යොමුකළ බව | වැඩිපුර ගෙවා ඇති මුදල වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපාරික ආයතන 78 ක් සඳහා පරිසර බලපත්‍ර ලබා නොදීම නිසා සභා අරමුදලට රු.351,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | කර්මාන්ත 08 ක් මේ වන විට පරිසර බලපත්‍ර ලබාගෙන ඇති බවත්, සමීක්ෂණ කටයුතු සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව | පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අනුමැතිය ලබා නොගෙන ගොඩනැගිලි ඉදිකිරීම, අනුමත ප්‍රමාණය ඉක්මවා ඉදිකිරීම් කටයුතු සිදුකිරීම, අනුකූලතා සහතිකය ලබානොගැනීම යන කරුණු වලට අදාළව ගොඩනැගිලි සැලසුම් 03 කින් රු.118,774 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.31,033 ක් අයකර ගත් අතර ඉතිරි හිඟ මුදල අයකර ගන්නා බව. | හිඟ මුදල් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | සභාව විසින් අනුමත කර තිබූ වානිජ්‍ය ගොඩනැගිලි 12 ක, නේවාසික ගොඩනැගිලි 20 ක සහ මායිම් තාප්ප 05 කට අදාළව නියමිත කාලය තුළ ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබීම මත වලංගු කාලය වසරකින් දීර්ඝ කර රු.185,000 ක ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වලංගු කාලය දීර්ඝකර ගන්නා ලෙස සිහිකැඳවීම් ලිපි අයදුම්කරුවන්ට යොමුකර ඇති බව | වලංගු කාලය දීර්ඝ කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව භුක්ති විඳින ඉඩම් 07 ක, සුසාන භූමි 07 ක සහ වාහන 02 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා සුසාන භූමි පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් සිටින බව. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභා අරමුදලින් රු.21,608,724 ක් වැයකර ඉදිකිරීම් කටයුතු සහ සංවර්ධන කටයුතු සිදුකර තිබූ කඩකාමර 04 ක්, පුස්තකාල ගොඩනැගිල්ලක්, ප්‍රජා ජල ව්‍යාපෘතියක් හා ජල කුළුනක් ප්‍රයෝජනවත් කාර්යයක නොයොදවා නිශ්කාර්යව තිබුණි. | කඩ කාමර 04 සඳහා නඩුවක් පවතින බවත්, පුස්තකාල ගොඩනැගිල්ල අබලන් වී ඇති බවත්, ජල ව්‍යාපෘතිය අවසන් බැවින් භාවිතයට නොගන්නා බව | වත්කම් ඵලදායිව උපයෝජනය සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සභාවේ භාවිතය සඳහා 2012 නොවැම්බර් 03 දින මිලදී ගෙන තිබූ 750x20 ප්‍රමාණයේ නැවත පුරවන ලද ටයර් දෙකක් ප්‍රයෝජනයට නොගත් කාලය සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට වසර 11 කට වඩා වැඩි වුයෙන් ඵලදායි ජීව කාලයද ඉක්මවා තිබුණත්, එම ටයර් ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙන්දේසි කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කරන බව. | වත්කම් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මදුනාගල කසල අංගනයේ මුරකුටිය අසල කැමරා පද්ධතියක් සවිකිරීම වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින ගබඩාවට ලද භාණ්ඩ සඳහා 2022 ජනවාරි 22 දින රු.355,950 ක් ගෙවීම් කර තිබුණද එම වත්කම් ප්‍රයෝජනයට නොගෙන විගණිත දින දක්වා ගබඩාවේ තබා තිබුණි. | කැමරා පද්ධතිය සවිකිරීම සඳහා සැපයුම්කරුවෙකු තෝරාගෙන සවි කිරීමට කටයුතු කරන බව | මිලදීගත් වත්කම් වගකීම් කාලය තුළ ප්‍රයෝජනයට ගතයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ අයවැය ලේඛනයේ සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ රු.5,500,000 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 15 න් රු.500,000 ක් වූ එක් සංවර්ධන ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | රු.මිලියන 02 ක් වූ කර්මාන්ත 04 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම්ගත වූ බවත්, රු.මිලියන 1.5 ක කර්මාන්ත 07 ක් අමුද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව | අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර ඇති සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 58 ක් හා 71 ක් වූයෙන් අතිරික්තතා 22 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට ඉල්ලීම් කළ බව. | කාර්ය මණ්ඩලයේ අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජුනි මස සිට වැඩ තහනම් කර තිබූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.250,418 ක ආපදා ණය සහ උත්සව අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 සණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් දෛනිකව රැස් කරනු ලබන කසළ, වෙන් කිරීමකින් තොරව අවිධිමත්ව බැහැර කර තිබූ අතර වසර කිහිපයකට පෙර ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ කොම්පෝස්ට් නිපදවීමේ කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන සමාලෝචිත වර්ෂයේදීත් ආරම්භ කර නොතිබුණි. | ප්‍රතිපාදන නොමැති බැවින් කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමට නොහැකි වූ බව | කසළ අවිධිමත්ව බැහැර නොකළ යුතු අතර ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය. |